(55)

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 55/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1989 ඔක්තෝබර් මස 30 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද නව වැනි සංශෝධනය
ප්‍රකාරව ආයතන සංග්‍රහයට සංශෝධන.

1984 අගෝස්තු 24 දින සිට බලපවත්වන පරිදි ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ.

2. (I) ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදයේ 1:1 වගන්තියේ අගට පහත දැක්වෙන වැකිය එකතු කරන්න.

" මෙම වගන්තියේ කාර්යයන් සඳහා "මාණ්ඩලික නිලධාරියා" හෝ "අධීක්ෂණ නිලධාරියා" යන්නෙන් අදහස් කරනුයේ 1970 නොවැම්බර් මස 18 වන දිනට කලින් ඇති කරන ලද ධූරයක් වූද, 1970 නොවැම්බර් මස 18 වන දිනදී, වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප, වර්ෂයකට රු. 6,720/=කට (74/60) නොඅඩු වූ නැතහොත් ඉන්පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ එකී ආරම්භක වැටුපට අනුරූප වෙතත් යම් වාර්ෂික වැටුප් පරිමාණයක් වූද යම් ධූරයක් දරන්නාවූ රජයේ නිලධරයෙක් හෝ 1970 නොවැම්බර් මස 18 වන දිනට පසුව ඇති කරන ලද ධූරයක් වූද ධූරය ඇති කරන දිනයේදී වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප ඉහත සඳහන් ධූරයකට ඒ දිනයේ දී අදාල වූ වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුපට නැතහොත් ඉන්පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ පළමු සඳහන් කළ ආරම්භක වැටුපට අනුරූප වෙතත් යම් වාර්ෂික වැටුප් පරිමාණයකට නොඅඩු වූද යම් ධූරයක් දරන්නා වූ රජයේ නිලධරයෙක්"

(පී.එච්.එම්. ප්‍රනාන්දු)
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය.

එන්/-